අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 468

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
දිසා විනිසුරු/ මහේස්ත්‍රාත්වරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිලධාරීන් විසින් රජයේ සේවයේ වෙනත් තනතුරක් සඳහා හෝ රජයේ සේවයෙන් පරිබාහිර තනතුරක් සඳහා හෝ විදේශ දූත මණ්ඩල සේවය සඳහා මුදා හරින ලෙස ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්</u>

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ දැනට පවතින පුරප්පාඩු සහ ඊට අනුශාංගිකව නව බඳවා ගැනීම් සිදු කිරීම සඳහා වන සීමා කිරීම් මත උපචය වී ඇති දැඩි සේවා අවශ්‍යතාවය හේතුවෙන් උපලේඛනගත රජයේ නිලධරයන්, රජයේ සේවයේ වෙනත් කිසිදු තනතුරක් සඳහා හෝ රජයේ සේවයෙන් පරිබාහිර වෙනත් කිසිදු තනතුරක් සඳහා හෝ විදේශ දූත මණ්ඩල සේවය සඳහා නැවත දැනුම් දෙන තෙක් මුදාහැරීම් සිදු නොකිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව ඔබ යටතේ සේවය කරන සියළුම උපලේඛනගත රජයේ නිලධරයන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙයින් දන්වමි.

03. එසේම යම් නිලධාරියකු විසින් ඉහත 01 ඡේදයේ සඳහන් තනතුරකට අයදුම්පතක් ඔබගේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී ඒ සබැඳිව ඔබගේ දැඩි අවධානය යොමු කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.සංජීව සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 දෙසැම්බර් මස ඒ 2 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.